# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2017.02.14

වේලාව : ප.ව. 12.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | **එම්.ඒ.බී. දයා සෙනරත් මයා.** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී. සෝමසිරි මයා.** | **-** | **ආණ්ඩුකාර ලේකම් (බ.ප)** |
| **3)** | **එම්.එස්.ඒ. තිලකරත්න මයා.** | **-** | **ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)** |
| **4)** | **හේමන්ත සමරකෝන් මයා.** | **-** | **සභා ලේකම් (බ.ප)** |
| **5)** | **චන්ද්‍රානි සමරකෝන් මිය.** | **-** | **ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **එස්.ජී.විජයබන්ධු මයා.** | **-** | **ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප)** |
| **7)** | **එම්.කේ.කේ.ආර්.අබේදීර මිය.** | **-** | **ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ.ප)** |
| **8)** | **එන්.නිල්වල මයා.** | **-** | **ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප)** |
| **9)** | **ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය.** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **10)** | **කේ.කේ.චම්පිකා කනේරු මිය.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)** |
| **11)** | **සිරිසෝම ලොකුවිතාන මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **12)** | **ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා.** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)** |
| **13)** | **නිශාන්ති විජේසුන්දර මිය.** | **-** | **අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)** |
| **14)** | **ආර්.ඒ.ටී.ආර්. රාමනායක මිය** | **-** | **අධ්‍යක්ෂ (සැලසුම්)** |
| **15)** | **කණිෂ්ක ශ්‍රීලාල් මයා.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **16)** | **කේ.එන්.සූරියආරච්චි මිය.** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳ ව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන් ට එළඹෙන ලදි.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එක ම භූමියක ස්ථාපිත කිරීම. | අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා පමණක් රන්මහපාය වෙන් කිරීමේ යෝජනාව සම්බන්ධව බොහෝ පාර්ශවයන් හි යහපත් ප්‍රතිචාර පවතින බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදි.<br>නව පරිශ්‍රය වෙත කාර්යාල ගෙන යාමේ දී ඉතිරි වන භාණ්ඩ සඳහා කටයුතු කළ යුතු ක්‍රමවේදය, මිල දී ගත යුතු භාණ්ඩ වල ඇස්තමේන්තුව සම්බන්ධව සාකච්ඡා කිරීමට රැස්වීමක් සංවිධානය කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 02. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය සහ සංචාරක බංගලා ඉදි කිරීම | අනුරාධපුර, නුවරඑළිය සහ කතරගම යන ප්‍රදේශ වල සංචාරක බංගලා ඉදිකිරීමට අවශ්‍ය ඉඩම් හෝ පසුගිය වසර 5 තුල දී සාදා නිම කරන ලද නිවාස සහිත ඉඩම් මිල දී ගැනීම වෙනුවෙන් සංශෝධිත පුවත්පත් දැන්වීම පළ කිරීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන). |
| 03. | සංවර්ධන වැඩසටහන් සහ ප්‍රගති සමාලෝචනය. | එක් එක් අමාත්‍යාංශ මඟින් මෙම වසරේ ජනවාරි මුල් සතිය තුල දී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පිළිබඳ විමසීමක් ප්‍රධාන ලේකම් විසින් සිදු කරන ලදි.<br><br>අතිගරු ජනාධිපතිතුමාගේ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 79 සහ හොරණ මාර්ගය ඉදිකිරීම ඇතුළු ව්‍යාපෘති නිරීක්ෂණය කර, එහි දී ගන්නා ලද ඡායාරූප සහ විස්තර ගරු ආණ්ඩුකාරතුමා හා ප්‍රධාන ලේකම් වෙත විද්‍යුත් තැපැල මඟින් යොමු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 04. | භාෂා ප්‍රතිපත්තිය, තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් නිල වෙබ් අඩවි යාවත්කාලීන කිරීම. | පළාත් සභාවේ සියලු ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන වල වෙබ් අඩවි 38ක් 2017.02.04 දින ප්‍රධාන ලේකම් විසින් නිරීක්ෂණය කල බව ප්‍රකාශ කළ අතර, එම වෙබ් අඩවි සියල්ලෙහි ම විවිධ අඩුපාඩු පවතින බව පෙන්වා දුන් අතර, නැවත එම වෙබ් අඩවි ප්‍රතිසංස්කරණය කිරීමට ITRDI ආයතනය සමඟ සම්බන්ධ වීමට අමාත්‍යාංශ වලට දින වෙන් කර ඇති බවත්, අදාළ දින වල සහභාගී වී එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලෙසත් දැන්වීය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 05. | තොරතුරු තාක්ෂණය මඟින් සේවා වැඩි දියුණු කිරීම. | නව පරිශ්‍රය සැලසුම් කිරීමේ දී, තාක්ෂණය උපරිම අන්දමින් භාවිතා කිරීමටත්, වාහන පරිපාලන ක්‍රමවේදයක් (Car Parking Management System) සැකසීම හා CCTV කැමරා සවි කිරීම සම්බන්ධව ද සාකච්ඡා විය.<br>කමිටු වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීම. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කමිටු සාමාජිකයන් |

| | | | |
|---|---|---|---|
| 06. | 2017 - දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් අධීක්ෂණය කරනු ලබන උක්ත ව්‍යාපෘතියේ ප්‍රගතිය ගරු ආණ්ඩුකාරතුමා වෙත වාර්තා කිරීම, සැලසුම් අංශයෙන් සිදු කරන බැවින්, එහි ප්‍රගතිය ඡායාරූප මාර්ගයෙන් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)<br><br>අධ්‍යක්ෂ, සැලසුම් |
| 07. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම. | සංවර්ධන නිලධාරි අතිකාල දීමනා ලබා දීම සඳහා තම ආයතනයන්හි ගෙවීම් සිදු කරන ආකාරය දන්වා එවන ලෙස සියලුම ආයතන දැනුවත් කළ ද, තවමත් මොරන්න පුහුණු මධ්‍යස්ථානයෙන් පමණක් පිළිතුරු ලත් බැවින්, අනෙකුත් ආයතන වලින් පිළිතුරු ලබා දෙන ලෙස දැනුම් දීම.<br><br>සමාජ සේවා/ග්‍රාම සංවර්ධන නිලධාරීන් යතුරුපැදි සහ දින වැටුප් ගන්නේ ද, එසේ ලබා ගන්නේ කුමන පදනමකින් ද යන්න, සෞඛ්‍ය හා ප්‍රවාහන අමාත්‍යාංශ වෙතින් විමසා ඇති නමුත් තවමත් පිළිතුරු නොලත් බැවින්, කඩිනමින් පිළිතුරු ලබා ගෙන යොමු කරන ලෙස දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 08. | වෙනිවැල්කොල ව්‍යාපෘතියට අයත් අත් කඩදාසි යන්ත්‍ර කොලොන්නාව කසල අංගනයට බැහැර කිරීම. | කොලොන්නාව කසල අංගනයේ ඇති අත් කඩදාසි යන්ත්‍රයේ කොටස් 58ක් දැනටමත් හඳුනාගෙන ඇති බවත් ඒවා කොලොන්නාව නගර සභා භාරයේ පවතින බවත් පළාත් පාලන ලේකම් ප්‍රකාශ කරන ලදී.<br>මේ සම්බන්ධයෙන් කරන ලද විමර්ශන වාර්තාව ප්‍රවාහන හා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එහි නිර්දේශ ප්‍රකාර ව කටයුතු ඉටු කර වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය. |
| 09. | ඔලියමුල්ල මහා විද්‍යාලය ඉදිකිරීම සම්බන්ධව. | ගොඩනැගිල්ල ඉදිකිරීම මුල් අදියර වන පාංශු පරීක්ෂාව සඳහා මිල කැඳවීම් මේ වන විටත් සිදු කර ඇති බැවින් ආයතනය තෝරා ගත් වහාම ඉදිරි කටයුතු ආරම්භ කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 10. | ගරු ආණ්ඩුකාරතුමාගේ නිල නිවස ඉදිකිරීම. | භූමියේ පාංශු පරීක්ෂාව සිදු කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කළ අතර, එහි වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | ආණ්ඩුකාර ලේකම්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 11. | මෙත් සෙවන රජයේ නිවර්තන නිවාසය පිහිටි ඉඩම ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට පැවරීම. | මෙත් සෙවන ආයතනයට අදාළ ගැටලුවෙහි වර්තමාන ප්‍රගතිය සම්බන්ධව ජනාධිපති ලේකම් දැනුවත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම.<br>ජනාධිපති ලේකම් සමඟ සාකච්ඡාවක් ලබා ගැනීමට කටයුතු කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය. |
| 12. | බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය ඉදිරියට පවත්වා ගෙන යාම පිළිබඳ තීරණය | බස්නාහිර පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරිය තව දුරටත් ඉදිරියට පවත්වා ගෙන යන්නේ ද යන කරුණ පරීක්ෂා කර, වාර්තාවක් ලබා දීමට සති 2ක කාලයක් ලබා දීම.<br>වාර්තාව කඩිනමින් ඉදිරිපත් කිරීම. | සභා ලේකම්<br><br>ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. |

| | | | |
|---|---|---|---|
| 13. | අභ්‍යන්තර විගණන නිලධාරීන් අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීම. | බස්නාහිර පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි විගණන සැලැස්මක් සැකසීම කෙරෙහි අවධානය යොමු කිරීම හා ලේකම්වරුන්ගේ නිර්දේශය යටතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීම.<br><br>විගණන වාර්තා සැකසීමෙන් පසු, එහි පිටපතක් ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීම. | සියලුම ලේකම්වරුන් |
| 14. | රාජ්‍ය ආයතන වල සේවක දිනයක් ප්‍රකාශයට පත් කිරීම හා ක්‍රියාත්මක කිරීම - 2017 | රාජ්‍ය සේවකයින්ගේ රාජකාරිමය සේවක ගැටලු විසඳා ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ගැනීම, සේවක ගැටලු ඉල්ලීම් ආයතන මට්ටමින් ලබා ගැනීමටත් හැකි තරම් අමාත්‍යාංශ මට්ටමින් විසඳුම් ලබා දීමටත් ඉටු කිරීමට නොහැකි වන ගැටලු 2017.03.31 දින ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී පැවැත්වීමට නියමිත "සේවක දිනය" සඳහා ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

<u>නව යෝජනා</u>

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අය විය යුතු හිඟ ආදායම් ප්‍රමාණය අය කර ගැනීම. | බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට වාහන ආදායම් බලපත්‍ර මගින් අය විය යුතු හිඟ ආදායම් ප්‍රමාණය අය කර ගැනීම පිළිබඳ ව මෝටර් රථ කොමසාරිස් සමඟ පවත්වන ලද සාකච්ඡාවේ තීරණ ක්‍රියාත්මක වේ දැයි පසු විපරම් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 02. | ක්‍රීඩා සතියට සමගාමී ව සිදු කළ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය වාර්තා කිරීම. | ක්‍රීඩා සතියට අදාළ ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු මට්ටමින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වල ඡායාරූප හා වීඩියෝ ප්‍රධාන ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කිරීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ ආයතන ප්‍රධානීන්. |
| 03. | දරුවන් සුරකිමු ජාතික වැඩසටහන 2017-2019 | "දරුවන් සුරකිමු" 2017 – 2019 ජාතික සැලසුම ක්‍රියාත්මක කිරීම යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද PS/DSP/7/CHILD I අංක හා 2017.01.23 දිනැති ලිපිය පිළිබඳ දැනුවත් කළ අතර, අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | |
|---|---|---|---|
| 04. | වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම 2016 – 2018 | "වකුගඩු රෝග නිවාරණ ජාතික සැලැස්ම 2016 – 2018" යන මැයෙන් ජනාධිපති ලේකම් විසින් යොමු කරන ලද PS/CKDU/AD/19 අංක හා 2016.12.30 දිනැති ලිපිය පිළිබඳ දැනුවත් කළ අතර, මෙම වැඩසටහනට සමගාමීව පළාත තුල සිටින වකුගඩු රෝගීන් හඳුනා ගැනීම හා රෝග ව්‍යාප්තිය වැළැක්වීමේ අරමුණින් වන දල සැලැස්ම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කර, අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක සැලැස්ම සකසා යොමු කිරීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 05. | 2016 වර්ෂයේ අමාත්‍යාංශ මට්ටමින් සංවර්ධන යෝජනා වල ප්‍රගතිය | 2016 වර්ෂයේ දී ඉටු කිරීමට සැලසුම් කරන ලද නමුත්, ඉටු කිරීමට නොහැකි වූ සැලසුම් පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශ මට්ටමින් ඉදිරිපත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 06. | සභා ලේකම් කාර්යාලයේ වෙබ් පිටු අස්ථානගත වීම සම්බන්ධව. | වෙබ් අඩවියට ප්‍රඥප්ති ඇතුළත් කිරීම සහ වෙබ් පිටු අස්ථානගත වීම යන මැයෙන් සභා ලේකම් විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධව ප්‍රධාන ලේකම් විමසීමක් කළ අතර, එය ITRDI ආයතනය වෙත යොමු කර වාර්තාවක් ලබා ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>සභා ලේකම් (බ.ප) |
| 07. | පළාත් රාජ්‍ය සේවය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමේ දී පවත්වන විභාග සඳහා ලකුණු ලබා දීම ක්‍රමවේදය. | අමාත්‍යාංශ වල විවිධ තනතුරු සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීමේ දී පැවැත්වෙන තරඟ විභාග සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය, බඳවා ගැනීම් පටිපාටියට අනුකූල විය යුතු බවත්, ලකුණු ලබා දෙන ක්‍රමවේදය සඳහන් නොවන අවස්ථාවක පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් අනුමැතිය ලබා ගත යුතු බවත්, ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 08. | බස්නාහිර පළාතේ පාසල් ආශ්‍රිතව ඩෙංගු ව්‍යාප්තිය මර්දනය කිරීම. | පාසල් වල ඩෙංගු ව්‍යාප්තිය මර්දනය කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් සැකසීම හා ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව සාකච්ඡා විය.<br>එසේ ම, මේ සම්බන්ධව කටයුතු නො කරන කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂ, විදුහල්පතින් සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට සිදු වන බව ද, පෙන්වා දෙන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |
| 09. | ජාත්‍යන්තර වෙසක් උත්සවය 2017 | 2017 වර්ෂයේ ජාත්‍යන්තර වෙසක් උත්සවය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සමගාමීව "බෞද්ධයා" නාලිකාව මඟින් සංවිධානය කරනු ලබන වෙසක් කලාපය සඳහා අමාත්‍යාංශ මට්ටමින් කුටි කීපයක් ලබා ගෙන නිර්මාණ ඉදිරිපත් කිරීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 10. | මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික ව්‍යාපාරය 2017 | කඩිනමින් ක්‍රියාකාරී සැලැස්ම සකසා ඉදිරිපත් කිරීම. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |